
# පුංචි නෙතූට පාඩමක්



සෙනුලි අහස්නා බණ්ඩාර

පුංචි නෙතුට පාඩමක්

සෙනුලි අහස්නා බණ්ඩාර

ISBN 978624208335-3

# පිදුම

ආදරණීය විදුහල්පතිතුමියටත්,

අකුරු කියාදෙන පන්තිභාර ගුරුතුමියටත්,

පොත ලිවීම සඳහා උපදෙස් ලබාදුන් සියලුම ගුරු දෙමාපියන්ටත්,

මාගේ දෙමාපියන්ටත්,

මෙම පොත පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

නෙතූ... නෙතූ....

කොයි වෙලාවෙ බැලුවත් නෙතු ගෙදර නෑ,

අනේ මන්දා මේ ළමයා කවදා හැදෙයිද? නෙතූගේ අම්මා හැම තැනම නෙතූව හොය හොය ඇවිදිනවා.

ඇයි අම්මේ මේ කෑ ගහන්නේ, මම මිහිරිලාගේ ගෙදර සෙල්ලම් කර කර හිටියේ.



ඇයි ළමයෝ මම කීපාරක් කිව්වද මට අසනීප නිසා ගේදොර අස්පස් කරලා ටිකක් අතුගාන්ඩ කියලා.

අනේ මේ අම්මේ මට නම් බෑ...

මම එනකම් මිහිරි බලාගෙන ඇති,

මම යනවෝ...

මම මෙච්චර අමාරුවෙන් වැඩට ගිහින් ආවේ ඔයාට කන්න දෙන්න සල්ලි හොයන්න, පංති යන්න ඉල්ලන ඉල්ලන සැරේට ඔයාට සල්ලි දෙන්න මම නැගිටලා හිටියොත් හොඳයි,

නෙතූගේ අම්මාට සැරෙන් සැරේ කලන්තේ දමමින් වැඩපලේදී අසනීප වෙනවා.

ඇයගේ යහළුවන් හැමදාම බනිනවා ඔය අසනීපෙට බෙහෙතක් ගන්න කියලා.

ඒත් නෙතූගේ අම්මා දවසේ හම්බවෙන සොච්චම ඉස්කෝලේ යවන්නයි, කෑමටයි මදි නිසා අත් බෙහෙත් කරමින් කාලය ගත කරා.

අම්මේ... අම්මේ...

මගේ සපත්තු දෙක කෝ....

උදෙන්ම පාසල් යන්නට සූදානම් වී නෙතූ කාමරයම පෙරලමින් හොයන්න ගත්තා.

''මොන මල වදයක්ද,

හැමදාම උදේට යන්න යනකොටද ඔයාට සපත්තු මතක් වෙන්නේ.

ඊයේ ගලවපු තැනම ඇති, පොත් බෑගය දොර මුල්ලේ... නෙතූ ඔයා ඉස්කෝලේ ගිහින් ආවා බෑග් එක විසි කරා, ගලෝපු ගලෝපු තැන්වල ඇඳුම්, කිසිම පොතේ පතේ වැඩක් කරන්නෙත් නෑ.

අර මනුස්සයත් මැරිලා ගියේ මගේ කරුමෙට,

ඔන්න පටන් ගත්තා,

ඔය බනේ අහලා මට ඇති වෙලා.

ඒකට මිහිරිගේ අම්මා, මිහිරිට ඉල්ලන ඉල්ලන දේ අරන් දෙනවා.

මම ආස කිසිම දෙයක් මට නෑ.

අනේ පුතේ, තාත්තා නැති වෙච්ච දවසේ ඉදන් ගාමන්ට් එකේ උදේ ඉදන් මහලා මහලා කකුල් ගෙවෙනකම් මම හම්බ කරන්නේ ඔයාටනේ,

මට ඉස්කෝලේ යන්න පරක්කු වෙනවා මම යනවා..

දුකින් වගේ නිවසින් පිටත්වු නෙතු ඉස්කෝලේ ගියා.



පන්තිභාර ගුරුතුමී පන්තියට ආවා,

ආයුබෝවන් ළමයි,

ආයුබෝවන් මැඩම්,

කෝ ගෙදර වැඩ ටික බලන්න ගන්න.

නෙතූට එතකොටයි මතක් උනේ ගෙදර වැඩ කරන්න අමතක උනා කියලා..

නෙතූ... කෝ පොත ගේන්න බලන්න,

මැඩම්......

ඇයි කෙකර ගාන්නේ,

වැඩ ටික කෙරුවේ නැද්ද?

කෝ බලන්න පොත,

මේ... මොනවත් කරලා නැනේ නෙතූ, ඇයි මේ,

කොහොමද විභාගෙට ලියන්නේ මෙහෙම වැඩ කරලා.

අනිත් ළමයි හොඳට වැඩ කරනවා.

ඉන්නවකෝ ඔහොම මම හොඳ වැඩක් කරන්න,

යනවා එළියට පන්තියෙන් අව්වේ දණ ගහනවා.



නෙතූ මැඩම් පංතියට එන්න කිවුවා,

සනුලි ඔය නපුරි ගියාද? අම්මෝ මගේ දණ හිස.

මාවමයි අල්ල ගන්නේ මට ඔය මැඩම් පේන්න බෑ.

ඇයි නෙතූ එහෙම කියන්නේ අපි එදිනෙදා වැඩ හොඳට කලොත් හොඳට විභාගය පාස් වෙලා ලොකු කෙනෙක් වෙන්න පුළුවන්. නෙතූගේ යාළුවෝ නෙතූට කිවුවා.

අනේ යන්න මම යනවා ඇතුළට කියමින් නෙතූ එතනින් පිටව ගියා.

නෙතූගේ ගුරුතුමිය හම්බෙන්න නෙතූගේ අම්මා දවසක් ආවා.

අවුරුද්දක් ඉවර වුණා ඒත් මේ ළමයා තවමත් හැදිලා නෑනේ නෙතූගේ අම්මේ..

මේ බලන්න වාර තුනේම අන්තිමයා නෙතූ, ඔයා හොයලා බලන් නැද්ද මෙහෙම ගියොත් අනිත් ළමයි විභාගේ පාස් වෙලා ටවුමේ ඉස්කෝලෙට යයි.

අනේ මැඩම් මමත් අසනීපකාරී, කොච්චර කිව්වත් වගක් නෑ පොතක් අල්ලන්නේ නෑ. කීයක් හරි හොයන් එනකම් මේකි දර කෑල්ලක්වත් හොයලා තියන්නෙ නෑ.

මම මෙච්චර කරත් මට කෑ ගහනවා. හොඳ කෑම නෑලු, පංති යන්න සල්ලි දෙන්නෑලු, හරිම හිතුවක්කාරයි මැඩම්,

හරි නෙතූගෙ අම්මේ මම බලන්නම්කෝ

කාලය ගත වුණා.

අනේ නෙතූගේ අම්මා හොදටම අසනීප වෙලා ඉස්පිරිතාලේ නවත්තලා.

මම නැතිව නෙතූ දැන් කොහොමද ගෙදර තනියම ඉන්නේ, ලෙඩ ඇඳේ ඉදන් නෙතූගේ අම්මා කල්පනා කලෙත් නෙතූ ගැනමයි.

නෙතූ බයෙන් හිටියේ අම්මා නැතිව කොහොමද ඉන්නේ කියලා.

නෙතූ ඉස්කෝලේ ගියෙත් නෑ, සෙල්ලම් කලෙත් නෑ,

අම්මා බලන්න උදේ හවස ඉස්පිරිතාලෙට ගිය නෙතූට ගොඩක් දුක හිතුණා.

එයාට මතක් වුණා අම්මා එයා වෙනුවෙන් කොච්චර කැපකිරීම් කරාද කියලා.



දවසින් දවස අම්මාගේ අසනීපය දරුණු වුණා.

දොස්තර මහත්තයා මගේ ඔළුව අතගාලා කිව්වා අපි ඉක්මණින් අම්මව හොද කරගමු.

එතකන් ඔයා හොඳට ඉගෙන ගන්න ඕන එතකොට තමා අම්මට සතුටු වෙන්නේ කියලා.

නෙතු මිහිරිගේ අම්මා සමග ගෙදර ගියා. නෙතු මිහිරිලාගේ ගෙදර යනකොට මිහිරි ඉස්කෝලේ ගිහින් ඇවිත් පාඩම් කරනවා.

නෙතුට දොස්තර මහත්තයා කියපු දේවල් මතක් වුණා.

මමත් මගේ පොත් ටික ගන්න ගෙදරට දිව්වා.

නෙතුත් ඇවිත් මිහිරිත් එක්ක පාඩම් කරා. උදේම අම්මාව බලන්න ගිහින් ඇවිත් ඉස්කෝලේ ගියා.

මම දැන් පාසල් වැඩ හොදින් කරනවා.

නෙතුගේ ගුරුතුමියට හරිම සතුටුයි නෙතු දැන් පන්තියේ වැඩ හොඳට කරනවා.

විභාගයට අත ළඟටම ආවා. නෙතු විභාගයට ලෑස්ති වුණා.

මේ අතර නෙතුගේ අම්මා ටිකෙන් ටික හොඳ වුණා.

මාස කිහිපයකට පස්සේ ප්‍රතිඵල ආවා. නෙතු විභාගය හොඳින් සමත් වෙලා.

නෙතුගේ ගුරුතුමී නෙතුට කතා කරා, නෙතු පේනවා නේද ඔයා හොඳට විභාගය සමත් වුනේ පාඩම් කරලා අම්මට කීකරු වුණ නිසා.

දෙමාපියන්ට කීකරු වෙලා ඉස්කෝලේ වැඩ හොඳින් උවමනාවෙන් කලොත් අපට හොඳින් ඉගෙන ගන්න පුළුවන්.

මේකනම් නෙතුට කවදාවත් අමතක වෙන්නෙ නැති පාඩමක් වෙයි.



**පසුවදන**

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්